ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව – 5/6 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2007

**නීති විද්‍යාව– LWU 4311/4321/3321**

කාලය – පැය තුනයි

---

දිනය: **2007** මාර්තු මස **27** වන දින  වේලාව  ප.ව.01.30  -ප.ව  04.30  දක්වා

---

ප්‍රශ්න <u>හතරකට</u> පමණක් පිළිතුරු සපයන්න.

**අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

1. රාජ්‍යයකට හෝ මිනිසුන් සමූහයකින් සමන්විත වන්නාවූ ඕනෑම ආයතනයකට අදාළ වන්නාවූ නීතිය සමන්විත වන්නේ එකී රාජ්‍යයේ හෝ ආයතනයේ විනිශ්චක අවයවය වන අධිකරණයන් මගින්, නෛතික අයිතිවාසිකම් හා යුතුකම් මොනවාද, යන්න තීන්දු කිරීමේදී අදාළ කරගනු පිණිස නියම කරන රීති වලිනි. … අධිකරණයන් විසින් ව්‍යවස්ථාවේ ඇති අප්‍රාණික වචන වලට ජීවය ලබා දෙයි.

   ඉහත සඳහන් අදහස තහවුරු කෙරෙන නීති විද්‍යාත්මක න්‍යායේ දාර්ශනික පදනම පැහැදිලි කරන්න. එමෙන්ම ශ්‍රී ලංකාවේ නීති පද්ධතියෙහි ස්වභාවය විස්තර කිරීම සම්බන්ධයෙන් මෙම න්‍යායෙහි ඇති ක්‍රියාකාරී ප්‍රයෝජනවත් බවද සාකච්ඡා කරන්න.

2. නීතියේ අරමුණ හා අධිකාරිත්වය පිළිබඳව තම මතය සමාජ ගිවිසුමක් මත පදනම් කිරීමට උත්සාහ කළ ස්වභාවික නීතිචින්තකයෝ, නීති සෑදීමට රජයට ඇති අයිතිවාසිකම්වල සීමාවන් පිළිබඳව පමණක් නොව, විශේෂයෙන්ම එවැනි සීමාවන් නොසලකා හරින අවස්ථාවන්වලදී එවැනි නොසලකා හැරීම් නීතිය හා සම්බන්ධව පවතින්නාවූ අවනතවීමේ වගකීමේ ප්‍රමාණය මත ඇති කරන්නාවූ අනුමිතීන් සම්බන්ධවද කතා කරති.

   අදහස් දක්වන්න.

   ඔබගේ පිළිතුර තුළ රජය විසින් නීති සෑදීමේ සිය අයිතිය ඉක්මවා ක්‍රියා කර ඇති ආකාරය දක්වන අවස්ථාවන් උදාහරණ ලෙස ගෙනහැර පාමින් එවැනි නෛතික අයිතිය ඉක්මවා යෑමේ අවස්ථාවන් නීතියට අවනත වීමේ වගකීම කෙරේ කවරාකාරවූ අනුමිතියන් උද්ගත කර තිබේද යන්න පැහැදිලි කළ යුතුය.

3. **(අ)** "ස්වකීය ප්‍රබල රාමුව සකස් කරන්නාවූ මෙකී වගන්ති දෙස බැලීමේදී පෙනී යන්නේ තනි රාජ්‍යයක් සංස්ථාපනය කරන්නාවූ භූමිය තුළ හා භූමිය සම්බන්ධයෙන් ස්වාධිපත්‍යය ජනතාව වෙත රඳා පවත්නාවූ සම්භාව්‍ය ජනරජයක

ආකෘතියක් පදනම් කරගෙන අප ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කර ඇති බවයි. ස්වාධිපත්‍යය යන්නට ජනතාව වෙනුවෙන් සහ ජනතාව වෙනුවෙන්වූ භාරයක්සේ රජයේ අදාළ අංගයන් මගින් ක්‍රියාවේ යොදවනු ලබන ව්‍යවස්ථාදායකය විධායකය සහ අධිකරණ බලය ඇතුළත් වේ. ජනතාවගේ ස්වාධිපත්‍යය තුළින් ලබාගන්නා ලද බලය රජයේ ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණ යන අංශ තුන විසින් භාවිතා කිරීමේදී කාර්යමය බලතල බෙදීමක් දක්නට ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර බලය ඉක්මවා යන අසීමිත බලයක් රජයේ මෙකී ආයතන වලට නොමැති අතර අධිකාරය භාවිතා කිරීමේ බලය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සහ ඉන් බලය ලබාගත් වෙනත් ලිඛිත නීති මගින් සීමාකර තිබේ."

<u>Nallaratnam Singarasa</u> Vs <u>The Attorney General</u> (Decided on 15.09.2006)

ඉහත සඳහන් තීන්දුව ඔස්ටින්ගේ ස්වාධිපත්‍ය යන සංකල්පය හා කොතෙක් දුරට එකගවේද?

**(ආ)** පහත සඳහන් ඒවායෙන් කුමක් ඔස්ටින්ගේ "ප්‍රකෘති නීතිය" යන යෙදුම තුළට අන්තර්ගතවේදැයි පැහැදිලි කරන්න.

(i). විවෘත විශ්ව විද්‍යාලයේ නේවාසිකාගාරයේ සිටින කාලය තුළදී ශිෂ්‍යයන් විසින් ඔවුන්ගේ අධ්‍යපන කටයුතු සම්බන්ධයෙන් එකිනෙකාට උපකාර කිරීම තහනම් කරමින් නේවාසිකාගාර පාලක විසින් නිකුත් කරන ලද නියෝගයක්.

(ii) ලෝකයේ ඕනෑම ස්ථානයකදී ගැබිනි කාන්තාවක් ඉදිරියේ දුම්පානය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත් කරමින් X නැමැති රාජ්‍යයේ පාලකයා විසින් නිකුත් කරන ලද නියෝගයක්.

4. ඓතිහාසික ගුරුකුලයේ දාර්ශනිකයන් විසින් නීති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී ඓතිහාසික වර්ධනය සිදුවූ ආකාරය අනුගමනය කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලදි. ඔවුන්ගේ මතය අනුව යම් ජාතියක ජනතාවගේ වර්ධනය සමග නීතියද වර්ධනයවන අතර ජනතාවගේ ශක්තිය අනුව නීතියද ශක්තිමත්වේ. අවසානයේදී ජාතියට සිය ජාතිකත්වය අහිමිවීමත් සමග නීතියේද පැවැත්ම අවසන් වේ. මෙම තර්ක කිරීමේ ක්‍රමය අනුව නීතියේ ප්‍රබල මූලාශ්‍රයක් බවට සිරිත් පත්වේ. ජන සමූහයක සාමූහික හා ඒකාකාරී පුරුදු සිරිත් බවට පත්වන අතර සිරිත් ඒවායේ උපරිම තලයේ දී බැඳෙන සුළු නියමයන් බවට පත්වේ.එහෙයින් සිරිත් ව්‍යවස්ථාවන්ට පෙර ආරම්භ වනවා පමණක්ද නොව ව්‍යවස්ථාවලට වඩා ඉහළ තත්වයකද පවතී.

සාකච්ඡා කරන්න

5. නීති විද්‍යාවට අයත් සමාජ විද්‍යා ගුරුකුලයේ වර්ධනය විදහා දක්වන සටහනක් ලියන්න

6. "ස්කැන්ඩිනේවියානු තත්ත්වාකාරවාදයෙහි මූලික දර්ශනයට අනුව 'වලංගුභාවය' හා 'වගකීම' වැනි නෛතික සංකල්පවලට විෂය මූලික යථාර්ථයක් නොමැති අතර එකී සංකල්පවල යථාර්ථ බලපෑම රඳා පවතිනුයේ සමාජයේ පවතින විවිධ ක්‍රියාකාරකම් සහ භාෂා භාවිතයන්ට ලබා දෙන්නාවූ මානසික ලෙස හැඩ ගස්වන ලද ප්‍රතිචාරයන් මතය. මේ අනුව බලන කල ගිවිසුම්ගත බැඳීමක් ඇතිකිරීම හෝ එසේත් නැත්නම් නෛතික අයිතිවාසිකමක් පිළිගැනීම යනු විධිමත් ක්‍රියාදාමයන්ට ලබා දෙන්නාවූ මානසික මට්ටමේ ප්‍රතිචාරයකි. මෙකී ප්‍රතිචාරයන් මගින් ඉහත දැක්වූ ආකාරයේ ගනුදෙනුවන්ට සහ එවන් ගනුදෙනු මත ගොඩ නැගෙන පසු හැසිරීම්වලට බැඳ තැබීමේ ගුණයක් ආරෝපනය කරනු ලබයි." [H. McCoubrey & N.D. White, "TEXTBOOK ON JURISPRUDENCE" second edition (1996),.p.168.]
ඉහත උපුටා දක්වන ලද ඡේදයේ ප්‍රකාශිත අදහස සංස්ථාපනය වීම සදහා ස්කැන්ඩිනේවියානු තත්ත්වාකාරවාදීන්ගේ විවිධ මතවාදයන් දායකවූ ආකාරය පැහැදිලි කරන්න.

7. ත්‍රැප්‍රොබේනියාවේ වත්මන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වෙනස් කිරීමක් සදහා එහි පාර්ලිමේන්තුවේ සාමාජිකයන්ගෙන් අවම වශයෙන් තුනෙන් දෙකක අනුමැතියක් අවශ්‍යවේ. මෑතකදී පවත්වන ලද මැතිවරණයේදී ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කර ඒ වෙනුවට සන්ධීය ලක්ෂණ වලින් යුත් නවආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් ස්ථාපනය කිරීම සදහා ත්‍රැප්‍රොබේනියාවේ ජනතාවගෙන් ජනවරමක් ඉල්ලා සිටින ලදි. එකී පක්ෂය මැතිවරණය ජයග්‍රහණය කළ මුත් එයට ලබා ගත හැකිවූයේ සමස්ත ජන්ද ප්‍රමාණයෙන් 45% ක ජන්ද ප්‍රතිශතයක් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම පක්ෂයට පාර්ලිමේන්තුව තුළ හිමි වුයේ සුළු බහුතරයක් පමණි. සන්ධීය ආණ්ඩු ක්‍රමයක් හදුන්වාදීමට විරුද්ධවූ හා ප්‍රධාන විපක්ෂය බවට පත් වූ ජාතික පක්ෂයට මැතිවරණයයේදී ලබා ගත හැකි වූයේ 35% ක ජන්ද ප්‍රතිශතයකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වෙනසකට අවශ්‍යතරම් සහයෝගයක් පාර්ලිමේන්තුව තුළ ලබාගත නොහැකි වුවද ත්‍රැප්‍රොබේනියාව සදහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් හදුන්වාදීමේ අරමුණ සදහා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් කැදවන ලදි. මෙම ක්‍රියා මාර්ගයට පක්ෂ ආධාරකරුවන් කියා සිටින පරිදි ත්‍රැප්‍රොබේනියාව සදහා සන්ධීය ආණ්ඩු ක්‍රමයක් හදුන්වාදීම පිණිස පසුගිය මැතිවරණයේදී ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට ජනතා වරමක් ලැබී ඇති බැවින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් කැදවීමට ගනු ලැබූ තීරණය වලංගුවේ. මේ අතර විරුද්ධ පක්ෂය වන ජාතික පක්ෂය පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යටතේ ත්‍රැප්‍රොබේනියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සතුවන සුපරීක්ෂක අධිකරණ බලය යදිමින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටියේ මේ සම්බන්ධයෙන් මැදිහත් වී ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් කැදවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාසම්පාදක මණ්ඩලයෙ පෙනීසිටීම්වල වලංගුභාවය පිලිබදව තීරණයක් ලබා දෙන ලෙසය.

ඒ අනුව ත්‍රැප්‍රොබේනියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විරුද්ධ පක්ෂය වන ජාතික පක්ෂයට වාසි සහගත තීරණයක් ලබාදෙමින් පවත්නා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අනුව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් කැදවන ලද ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ රැස්වීම්වලට නෛතික බලයක් නොමැති බවට තීරණය කරන ලදි. එහෙත් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව නොසලකමින් ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ කටයුතු දිගටම කරගෙන ගියේය. පවත්නා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන වලට පිටින් යමින්

ත්‍රැප්‍රොබේනියාව සඳහා අළුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වාදීමට එම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය දැන් සූදානම් වේ.

ත්‍රැප්‍රොබේනියාව සඳහා නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වාදීමට ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය තෝරාගත් මාර්ගයෙහි නීතිවිද්‍යාත්මක අනුමිතින් කෙල්සන්ගේ නෛතික වලංගුභාවය පිළිබඳ න්‍යාය ඇසුරින් සාකච්ඡා කරන්න.

8. නීතිය යනු පාලන බලය ඇති පංතියට එකී බලයට අභියෝග කරන කණ්ඩායම් පාලනය කිරීමට හා යටපත් කරීමට හැකියාවක් ලබාදෙන පන්ති ආධිපත්‍ය මෙවලමක් ලෙස විස්තර කරනු ලබන මතවාදයෙහි, ශක්තීන් හා දුර්වලතාවයන් ශ්‍රී ලංකාවේ නීති පද්ධතියෙන් ලබා ගත් යෝග්‍ය නිදසුන් භාවිතා කරමින් පැහැදිලි කරන්න.

හිමිකම් ඇවිරිණි
************